# ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය
## 25(A) ඉන්දීය ඉතිහාසය
## 13 ශ්‍රේණිය
## දෙවන වාර පරීක්ෂණය-2019
## (ඈත අතීතයේ සිට ක්‍රි.ව.1206 දක්වා)

11 පත්‍රය (1කොටස) කාලයඃ පැය 03

සැලකිය යුතුයි
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර හෝ තෝරන්න කාලය පැය 3

අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

01) 1) බෝලාන් 2) බයිබර් 3)මක්‍රාන්
4) බැරෝඩා 5) කාරකෝරම්

02) 1) ෆාහියන් 2) තාරානාථ 3)හියුං-ත්සාන්
4) ඉට්සිං 5) සං-යුං

03) 1) රූපාර් 2) හරප්පා 3) ඉන්ද්‍රප්‍රස්ථ
4) චන්හුදාරෝ 5) මොහෙන්ජොදාරෝ

04) 1) කාල්සි සෙල්ලිපිය 2) සොපාරා සෙල්ලිපිය 3) ධෞලි සෙල්ලිපිය
4) නාසික් සෙල්ලිපිය 5) ගිර්නාර් සෙල්ලිපිය

05) 1) ආර්යදේව 2) අශ්වඝෝෂ 3) නාගර්ජුන
4) වසුමිත්‍ර 5) වසුබන්දු

අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන. ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11)
(1) බිම්බිසාර - කෝසල දේවි
(2) ප්‍රභාකර වර්ධන - දන්තා දේවි
(3) අශෝක - විදිසා දේවි
(4) ග්‍රහවර්මන් - රාජ්‍ය ශ්‍රී
(5) දෙවන චන්ද්‍රගුප්ත - කුවේර නාගා (...............)

12)
(1) රුද්‍රදාමන් - ජුනාගාද් ලිපිය
(2) සමුද්‍රගුප්ත - අලහබාද් ප්‍රශස්තිය
(3) කනිෂ්ක - රුම්න්දෙයි ලිපිය
(4) ඛාරවේල - හත්ථි ගම්පා ලිපිය
(5) දෙවන පුලකේෂින් - අයිහෝලේ ලිපිය (...............)

13)

(1) ථානේශ්වර - පුෂ්‍යභූති
(2) කනෞජය - පාල
(3) පෙෂාවෝර් - කුෂාණ
(4) ප්‍රතිෂ්ඨාන - සාතවාහණ
(5) මධුරා - පාජ/ඔස (................)

14)
(1) චම්පා - අංග
(2) වාරානසි - කාසි
(3) කුසිනාරා - සූරසේන
(4) ශ්‍රාවස්ති - කෝසල
(5) උජ්ජයිනි - අවන්ති (................)

15)
(1) කල්හාණ - මාලවිකාග්නිමිත්‍ර
(2) පතංජලී - මහාභාෂ්‍ය
(3) බාණභට්ට - හර්ෂ චරිතය
(4) ශුද්‍රක - මැටි කරත්තය
(5) විශාකදත්ත - මුද්‍රාරාක්ෂ්‍ය (................)

අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X තීරුවේ දී ඇත. Y තීරුවේ ඇති නාම/ප්‍රකාශන/දින වකවානු සමග කිසියම් ආකාරයකට ගැළපේ. නමුත් ඒවා නිසි අනුපිළිවෙලකට දක්වා නැත. නිවැරදි පිළිවෙලකට ගැළපූ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයේ අංකය වරහන තුළ ලියන්න.

16) X | Y
(i) කෘෂ්ණා | A මාල්වා උස්බිම්
(ii) සින්දු | B හිමාලය
(iii) චම්බාල් | C ඩෙකාන් සානුව
(iv) බ්‍රහ්මපුත්‍ර | D බටහිර ඝාට්ස්
(v) මහානදී | E ටිබෙට්

(1) ADCBE (2) BEDCA (3) CAEDB
(4) DBAEC (5) ECBAD (................)

17) X | Y
(i) ව්‍යාකරණ | A සූර්ය සිද්ධාන්ත
(ii) තාරකාශාස්ත්‍ර | B රාජතරංගණී
(iii) දර්ශනය | C මහාභාෂ්‍ය
(iv) මහාකව්‍ය | D රඝුවංශ
(v) ඉතිහාසය | E සාංඛ්‍යසූත්‍ර

(1) ADCBE (2) BEDCA (3) CAEDB
(4) DBAEC (5) ECBAD (................)

18) X | Y
(i) පුරෝහිත | A සේනාපති
(ii) සේනානි | B රථාචාර්ය
(iii) සංගෘහිත්‍රි | C රජුගේ උපදේශක
(iv) භාගදුග | D බදු එකතු කරන්නා
(v) සූත | E භාණ්ඩාගාරික

(1) ADCBE (2) BEDCA (3) CAEDB
(4) DBAEC (5) ECBAD (..................)

19) X Y

(i) උතුරු සළුව — A බෘහස්පති
(ii) පෘථිවි — B සාවිත්‍රි
(iii) ආකාශ — C අධිවාස
(iv) වර්ණාශ්‍රම — D වෘත
(v) නේපාද — E සන්‍යාසි

(1) BAECD (2) CDAEB (3) BACDE
(4) CABED (5) DECBA (..................)

20) X Y

(i) මහේන්ද්‍රගිරි — A පිෂ්ටපුර
(ii) උග්‍රසේන — B මහාකාන්තාර
(iii) නීලරාජ — C පල්ලක්ක
(iv) ව්‍යාග්‍රරාජ — D වෙංගි
(v) හස්තිවර්මන් — E අවමුක්ත

(1) ABECD (2) ACEBD (3) ACDBE
(4) AEDBC (5) ADEBC (..................)

**අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21) වෛදික යුගයේදී ඉන්දිය රජකු විසින් තම පාලනය ආරම්භ කලේ කුමන යාගයකින් පසුවද?
I) රාජශුය ii) වාජ්පේය iii) අශ්වමේධ
iv) පුරුෂමේධ v) ගයත්‍රී (..................)

22) මගධය පාලනය කළ රාජවංශ වලට අයත් නොවන්නේ කුමක්ද?
I) හර්යංක ii) ශිශුනාග iii) මෞර්ය
iv) යාධව v) නන්ද (..................)

23) සර්වස්ති වාදීන්ගේ ධර්ම සංගායනාව පැවති නගරය මින් කවරක්ද?
I) පාටලීපුත්‍ර ii) පෙෂාවෝර් iii) තක්ෂිලා
iv) රජගහනුවර v) කාශ්මීරය (..................)

24) නහපාන පරාජය කල සාතකර්ණි පාලකයා කවුද?
I) ක්‍රිෂ්ණ ii) පළමු සාතකර්ණි iii) සිමුඛ
iv) ගෞතමිපුත්‍ර සතකර්ණි v) වශිෂ්ඨපුත්‍ර පුලමායි (..................)

25) හියුත්සාන් හිමි ඉන්දියාවට පැමිණියේ කිනම් රාජ්‍ය කාලයේද?
I) කණිෂ්ක ii) සාතකර්ණි iii) දෙවන චන්ද්‍රගුප්ත
iv) හර්ෂ v) යශෝධර්මන් (..................)

අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාල මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.

**26)** රඛිගාර්හි

1. හරප්පා ශිෂ්ටාචාරයේ විශාලතම නගරය
2. හරප්පාවේ ප්‍රධානම වානිජ නගරය වීම
3. එස්.ආර්.රාඕ විසින් කැණීම් කර සොයා ගැනීම
4. ක්‍රි.පූ.**1650** දී බිඳ වැටීම
5. පාලක පන්තිය මෙහි සිට පාලනය කරන්නට ඇති බව හා පරිපාලන නගරය වූ බව (..................)

**27)** අශෝක සෙල්ලිපි

1. ඉන්දියාවට සෙල්ලිපි ලිවීමේ සම්ප්‍රදාය මුලින්ම හදුන්වා දුන්නේ මහා ඇලෙක්සැන්ඩර්ය
2. අශෝක සෙල්ලිපි ඉන්දියාවේ පමණක් නොව අෆ්ගනිස්තානය හා නේපාලය ප්‍රදේශවලින් ද හමුවේ
3. අශෝක සෙල්ලිපි බහුතරයක් බ්‍රාහ්මී අක්පරවලින් ලියා තිබේ
4. අශෝකගේ සමහර ලිපි ග්‍රීක හා අරමයික් භාෂාවලින් ලියා තිබේ.
5. අශෝක රජු ලිපි මගින් සෘජුවම මහජනතාව අමතයි (..................)

**28)** මෞර්ය රාජවංශය හා අනුරාධපුර රජවරුන්

1. දෙරට අතර පළමු රාජතාන්ත්‍රික සම්බන්ධතා මහින්ද හිමියන්ගේ පැමිණීමත් සමග ආරම්භ විය
2. තිස්ස රජු දෙවනපිය යන විරුදය භාවිත කලේය
3. පාලකයින් දෙදෙනා අතර තෑගි භෝග හා තානාපති සබඳතා පැවතීම
4. බුද්ධාගම වැළඳගත් දේවානම්පියතිස්ස රජු ඊට අනුග්‍රහය දැක්විය
5. සංඝමිත්තා මෙහෙණිය ශ්‍රී මහාබෝධින්හි ශාඛාවක් ගෙන ඒම (..................)

**29)** කාලිදාස

1. කාලිදාස යනු දෙවන චන්ද්‍රගුප්ත රාජ සභාවේ සිටි එක් පඩිවරයකි
2. රඝුවංශය හා කුමාරසම්භව මොහුගේ ශ්‍රේෂ්ඨ කාව්‍ය ග්‍රන්ථ දෙකකි
3. භාරවී කාලිදාසගේ ශිෂ්‍යයෙක් විය
4. ශ්‍රී ලංකාවේ කුමාරදාස රජු කාලිදාසගේ සමකාලීනයෙකු ලෙස සැලකේ
5. කාලිදාස සන්දේශකාව්‍ය සම්ප්‍රදායේ ආරම්භකයා ලෙස සැලකේ (..................)

**30)** සාතවාහනයෝ

1. සාතවාහනයෝ බ්‍රාහ්මණ වංශිකයන් බව නාසික් සෙල් ලිපියේ දක්වයි
2. ගෝධාවරී හා ක්‍රිෂ්ණා අතර වූ ආන්ද්‍ර ප්‍රදේශය සාතවාහනයන් යටතේ පැවති ප්‍රධාන භූමි භාගය විය
3. පළමුවැනි සාතකර්ණි රජු දක්ෂිණාපථපති යන විරුදය ලැබීය
4. සාතවාහනයන්ගේ වඩාත් කැපී පෙනෙන රජු වූයේ ගෞතමී පුත්‍ර සාතකර්ණි රජුය
5. නහපාන විසින් ගෞතමීපුත්‍ර සාතකර්ණි රජු පරදා මරා දැමීය (..................)

අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් .............................. **1** ද,

(B) සහ (C) පමණක් නිවැරදි නම් .............................. **2** ද,

(C) සහ (D) පමණක් නිවැරදි නම් .............................. **3** ද,

(A) සහ (C පමණක් නිවැරදි නම් .............................. **4** ද,

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .................................. **5** ද, වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| (A) සහ (B) පමණක් නිවැරදිය | (B) සහ (C) පමණක් නිවැරදිය | C) සහ (D) පමණක් නිවැරදිය | (A) සහ (C පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය |

**31**) ඍග් වෛදික යුගය

A) වර්ණ ක්‍රමය දැඩි ලෙස ක්‍රියාත්මක නොවීය

B) කාන්තාවන්ට යාඥා සඳහා සහභාගි වීමට අවසර නොවීය

C) මෙම අවධියේ ප්‍රධාන දෙවිවරුන් දෙදෙනෙකු වූයේ වරුණ හා ඉන්ද්‍රය

D) දෙවියන් අදහන එක් ක්‍රමයක් වූයේ බිලි පූජාය (..................)

**32**) කනිෂ්ක

A) වීම කැඩ්පයිසිස්ගෙන් පසු කනිෂ්ක රජකමට පැමිණියේය

B) ඔහුගේ රාජ්‍ය සමයේදී බුද්ධාගමේ ප්‍රචාරය සඳහා චීනය දක්වා ප්‍රදේශ වලට භික්ෂූන් වහන්සේ පිටත් කර හැරියේය

C) ඔහුගේ රාජධානියේ අගනුවර වූයේ මථුරා නගරයයි

D) නාගර්ජුන හිමි හතරවන ධර්ම සංඝායනාවේ මූලසුන හොබවන ලදී (..................)

**33**) සුංගයෝ

A) සුංගයෝ ක්ෂත්‍රිය වර්ණයට අයත් වූහ

B) අන්තිම මෞර්ය රජ වූ බෘහද්රථ මරා සුංග වංශයේ ආරම්භකයා වූ පුෂ්‍යමිත්‍රසුංග සංහාසනාරූඪ විය

C) සුංගයන් විසින් ග්‍රීකයන් තවදුරටත් ඉන්දියාවට කඩා වැදීම වළක්වන ලදී

D) අමරාවතී හි බුදුරජානන් වහන්සේ පිළිබඳ දැක්වෙන කැටයම කොටවන ලද්දේ සුංග පාලන සමයේදීය

(..................)

**34**) හර්ෂවර්ධන රජු

A) ථානේෂ්වරයේ රජ්‍යවර්ධන හර්ෂවර්ධන රජුගේ සහෝදරයාය

B) හර්ෂවර්ණ රජු ¨ශිලාදිත්‍ය¨ නමින්ද හැඳින්වේ

C) හර්ෂවර්ධන රාජ්‍ය කාලය පිළිබඳ ෆාහියන් හිමි තොරතුරු සපයයි

D) කනෞජයේ මෞකරි රජවංශයේ ආරම්භකයා හර්ෂවර්ධන රජුය

(..................)

**35**) ගුප්ත අධිරාජ්‍ය බිඳ වැටීමට හේතු

A) ස්කන්ධගුප්තගෙන් පසු පැමිණි දුර්වල පාලකයන්

B) රාජ්‍ය පදප්‍රාප්තිය පිළිබඳව ස්ථාවර නීති සම්ප්‍රදායක් නොවීම

C) හූණ ආක්‍රමණය

D) දේශසීමාවල ආරක්ෂාව අතපසු කිරීම

(..................)

අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න වලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1,2,3,4** හා **5** යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | නිවැරදිය |
| 2 | නිවැරදිය | වැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| පළමුවැනි ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|
| **36)** හරප්පා ශිෂ්ටාචාරයේ මුද්‍රා වලින් එහි ජනතාවගේ ආගමික පිළිවෙත් හෙළිවේ | හරප්පා ශිෂ්ටාචාරය ලෝකයේ ඉපැරණි ශිෂ්ටාචාරය ලෙස පිළිගැනේ | (..................) |
| **37)** අශෝක රජු යටතේ මහාමාත්‍රවරුන්ට පැවරී තිබුණු රාජකාරිය වූයේ වැසියන් අතර බුද්ධාගම ප්‍රචාරය කිරීමය | ධර්මමහාමාත්‍රවරුන්ගේ වගකීම වූයේ (අශෝක) ධර්මය ප්‍රචාරය කිරීමය | (..................) |
| **38)** ගුප්ත යුගයේදී උතුරු ඉන්දියාවේ ථේරවාදී බුද්ධාගමේ පිබිදීමක් දක්නට ඇත | බුද්ධ ප්‍රතිමා නිර්මාණය ආරම්භවූයේ ගුප්ත යුගයේදීය | (..................) |
| **39)** ගන්ධාර කලා සම්ප්‍රදාය ග්‍රීක-බෞද්ධ සම්ප්‍රදායක් ලෙස හැඳින්වේ | ගන්ධාර කලා සම්ප්‍රදායේ ප්‍රධාන අනුග්‍රාහකයෝ කුෂාණ පාලකයෝය | (..................) |
| 40) කුෂාණයන් පන්නා දැමීමෙන් අනතුරුව සාතවාහනයෝ ඩෙකානයේ රාජ්‍යයක් පිහිටුවීමට සමත් වූහ | ඩෙකානයේ පළමුවෙන්ම අධිරාජ්‍යයක් පිහිටුවන ලද්දේ සාතවාහනයන් විසිනි | (..................) |

(ලකුණු 40)

## (25 A) ඉන්දීය ඉතිහාසය
## (ඈත අතීතයේ සිට ක්‍රි.ව.1206 දක්වා)
## 11 පත්‍රය (2 කොටස)

සැලකිය යුතුයි

- පළමුවන ප්‍රශනය **අනිවාර්යය** වේ
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **එක බැගින්** තෝරාගෙන ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න
  (පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.

---

### A කොටස

ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න

| | | |
|---|---|---|
| (i) මොහෙන්ජොදාරෝ | (ii) හරප්පා | (iii) කාවේරි ගඟ |
| (iv) සුලෙයිමාන් කඳුවැටිය | (v)තාම්‍රලිප්ති | (vi) කනෞජ් |
| (vii) පුරුෂපුර | (viii) මදුරෙයි | (ix) අයිහෝලේ |
| (x) කාංචි | (xi) ලොතාල් | (xii) අජන්තා |

(ලකුණු 12)

### B කොටස

2) ඉන්දු - ගංගා නදී මිටියාවත් ඉන්දීය ඉතිහාසය කෙරෙහි ඇති කළ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 16)

3) හරප්පා සභ්‍යත්වයේ පැවති සමාජ හා ආර්ථික තත්ත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 16)

4) අශෝක රජුගේ ධර්ම ප්‍රතිපත්ති සාකච්ඡා කරන්න. (ලකුණු 16)

5) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.

(i) හිමාල කඳුවැටිය
(ii) මහා ඇලෙක්සැන්ඩර් රජතුමා
(iii) පැරණි ඉන්දියාවේ ගණ රාජ්‍ය පැවැත්වූ ස්ථාන දෙකක් නම් කරන්න

(ලකුණු 16)

## C කොටස

6) කුෂාණයන්ගෙන් ඉන්දීය සංස්කෘතියට සිදුවූ මෙහෙය විස්තරාත්මකව විග්‍රහ කරන්න

7)¨සත්‍ය වශයෙන් සමුද්‍රගුප්තගේ සම්පූර්ණ කාර්ය යුදමය කටයුත්තකි

(i) ඔහුගේ යුධ ව්‍යාපාරය ගැන දැක්වෙන අභිලේඛනය නම් කරන්න
(ii) ඔහුගේ පූර්වප්‍රාප්තිකයා හා අනුප්‍රාප්තිකයා නම් කරන්න
(iii) ගුප්ත රාජ්‍ය ව්‍යාප්තියේ ලා සමුද්‍රගුප්තගේ කාර්යභාරය ප්‍රමාණ කරන්න
(iV) ඉහත උධෘතය විචාරාත්මකව විග්‍රහ කරන්න

(ලකුණු 16)

8) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න

(i) අලහබාද් ප්‍රශස්තිය
(ii) 11 චන්ද්‍රගුප්ත යටතේ අධිරාජ්‍ය ව්‍යාප්තිය
(iii) හූණ ආක්‍රමණ
(iV) ගෞතම්පුත්‍ර සාතකර්ණි රජතුමා

9) ගුප්තයන්ගෙන් පසු උතුරු ඉන්දියාවේ බලයට පැමිණියේ හර්ෂවර්ධන රජතුමාය

(i) හර්ෂවර්ධන රාජ්‍ය කාලය පිළිබඳ දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍රයක් නම් කරන්න
(ii) ඔහුගේ රාජ්‍ය සමයේදී බෞද්ධ සම්මේලන පැවැත්වූ ප්‍රධාන ස්ථාන දෙකක් නම් කරන්න
(iV) ඔහු කනෞජයේ බලයට පැමිණි ආකාරය කෙටියෙන් විස්තර කරන්න
(V) උතුරු ඉන්දියානු ආධිපත්‍යයේ මධ්‍යස්ථානය බවට කනෞජය පත් කිරීමෙහිලා හර්ෂවර්ධනගේ දායකත්වය සාකච්ඡා කරන්න

(ලකුණු 16)

# (25 A) ඉන්දීය ඉතිහාසය

(පෙර ඉතිහාසයේ සිට ක්‍රි.ව. 1206 දක්වා)

II කොටස

